# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1810/26 – 2013 මැයි 14 වැනි අඟහරුවාදා – 2013.05.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 146 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/12/2012/සීඊබී/332.

ප්‍රා.ලේ.ගේ යොමු අංකය: 3/2/6/4/1/28.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 මැයි මස 09 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කොත්මලේ.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපනේ කෝරළේ සුළු කොට්ඨාසයේ මැදකුඹුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එන්යූ/කේටීඑම්/2012/257 හා හා 2012.12.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0115ක් පමණ වූ ඉඩම් කැබල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මැදකුඹුරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0115ක් පමණ**
උතුරට: පාර (වත්ත); නැගෙනහිරට, දකුණට සහ බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

05 - 814

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 147 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/12/2012/සීඊබී/103.

ප්‍රා.ලේ.ගේ යොමු අංකය: 3/2/6/4/1/27.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත


මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 මැයි මස 09 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කොත්මලේ.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපනේ කෝරළේ සුළු කොට්ඨාසයේ හාල්පොල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එන්යු/කේටීඑම්/2012/79 හා 2012.06.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0101ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හාල්පොල පොල්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0101ක් පමණ**

උතුරට: එස්. බී. විජේසුන්දර සහ එච්. බී. විජේසුන්දර හිමිකම් කියන හාල්පොල පොල්වත්ත; නැගෙනහිරට: එස්. බී. විජේසුන්දර සහ එච්. බී. විජේසුන්දර හිමිකම් කියන හාල්පොල පොල්වත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ එස්. බී. විජේසුන්දර සහ එච්. බී. විජේසුන්දර හිමිකම් කියන හාල්පොල පොල්වත්ත; බටහිරට: එස්. බී. විජේසුන්දර සහ එච්. බී. විජේසුන්දර හිමිකම් කියන හාල්පොල පොල්වත්ත.

05 - 815

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

### 2013 අංක 148 දරන ආඥාව

මගේ යොමු අංකය: 4/3/9/2011/ඩබ්එස්/215.
ප්‍රා.ලේ.ගේ යොමු අංකය: කු/ප්‍රාලේ/16/4/53.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ සවිස්තරව ඇති පරවශ්‍යතාවයට යටත් වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 මැයි මස 09 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ ගුන්නෑපාන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/කේඑන්ඩී/2012/520 හා 2012.10.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ ලෙස සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0128ක් පමණ වන ගල්ලෙනගොඩහේන නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

2. **පරවශ්‍යතාවේ විස්තරය.**– කුණ්ඩසාලේ ජල සම්පාදන ක්‍රමයේ උයන්වත්ත ජල ටැංකියේ ප්‍රවේශ මාර්ගය සහ ජල නළ එළීම සඳහා ඉඩමේ පරවශ්‍යතාවය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර 'ඒ' – ගල්ලෙනගොඩහේන – ප්‍රමාණය: හෙක්. 0.0128ක් පමණ**

උතුරට: ආර්. ඩබ්. එම්. අමරපාල හිමිකම් කියන ගල්ලෙනගොඩහේන සහ මූ.පි.මහ. 6076හි කැබලි අංක 1; නැගෙනහිරට: මූ.පි.මහ. 6076හි කැබලි අංක 1 සහ ආර්. ඩබ්. එම්. අමරපාල හිමිකම් කියන ගල්ලෙනගොඩහේන; දකුණට: ආර්. ඩබ්. එම්. අමරපාල හිමිකම් කියන ගල්ලෙනගොඩහේන; බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ආර්. ඩබ්. එම්. අමරපාල හිමිකම් කියන ගල්ලෙනගොඩහේන.

05 - 816

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2013 අංක 100 දරන ආඥාව අවලංගු කිරීම

මගේ යොමු අංකය: 4/3/9/2011/ඩබ්එස්/215.
ප්‍රා.ලේ.ගේ යොමු අංකය: කු/ප්‍රාලේ/16/4/53.

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත අර්ථ නිරූපන ආඥාපනතේ (12 වන අධිකාරය) 18 වැනි වගන්තියට අනුකූලව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම අංක 1805/23 හා 2013.04.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ 2013 අංක 100 දරන ආඥාව මෙයින් අවලංගු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 මැයි මස 09 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 817

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.